# ගුවන් විදුලි මාධ්‍ය සඳහා මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්

**කේ. ජී. ඩී. කුමාරි**[1]

**ධම්මික බණ්ඩාර හේරත්**[2]

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**සංක්ෂේපය**

ගුවන් විදුලි මාධ්‍ය වර්තමානයේ ද අද්විතීය ස්ථානයක් හිමිකරගෙන ඇත. එවැනි මාධ්‍යයක ගුවන් විදුලි මාධ්‍යවේදියාගේ කාර්යයභාරය ද තීරණාත්මක වේ. එය වඩාත් ඵලදායීයව ඉටු කිරීම සඳහා මාධ්‍ය ආචාරධර්ම තිබීම වැදගත්ය. ආචාරධර්ම තුළින් ඇති කරනුයේ ප්‍රමිතීන්ය. වර්තමානයේ ගුවන්විදුලි මාධ්‍යවේදීන් සඳහා පිළිගත් පොදු මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් නොමැත. ගුවන් විදුලි මාධ්‍ය සඳහා ආචාරධර්ම පද්ධතියක ඇති අවශ්‍යතාව සොයා බැලීමත්, අවශ්‍යනම් එහි ස්වභාවය කවරාකාර ද යන්න යෝජනා කිරීමත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

මෙම අධ්‍යයනයේදී පර්යේෂණ ගැටලුව වූයේ, ගුවන් විදුලි මාධ්‍ය සඳහා මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් අවශ්‍යද? යන්න සොයා බැලීමයි. මෙහිදී ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය යොදා ගැනිණි. ඒ යටතේ ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ක්‍රම භාවිතා විය. එමෙන්ම තෝරාගත් ගුවන් විදුලි නාලිකා 4කට අදාළව 2015 ඔක්තෝම්බර් මස 01වනදා සිට 07වනදා දක්වා උදෑසන 6 සිට රාත්‍රී 10 වන තෙක එම නාලිකාවන්හි අනතර්ගතය පිළිබඳ විශ්ලේෂණයක් ද සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණයේදී SPSS 21 සහ Excell 2010 මෘදුකාංග භාවිතයට ගන්නා ලදී. පටිගත කරන ලද දත්ත විශ්ලේෂණයේදී Adobe Audition 1.5 මෘදුකාංගය භාවිතයට ගැනුණි.

මෙම අධ්‍යයනය තුළින් ලබාගත් පොදු නිගමනය වන්නේ ගුවන් විදුලියේ මාධ්‍ය ආචාරධර්ම කඩවීම් සිදුවන බවයි. ඒ අනුව එම තත්ත්වයන් මර්දනය කිරීම සඳහා ගුවන් විදුලි මාධ්‍ය ආචාරධර්ම පද්ධතියක් යෝජනා කිරීම සිදුවිය.

මුඛ්‍ය පද - මාධ්‍ය, ආචාරධර්ම, ගුවන් විදුලිය, මාධ්‍යවේදීන්, ශ්‍රාවකයින්

---

*1. ජනසන්නිවේදනය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*